980 - 3 - 5
කො. ළ. බ.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 52 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 දෙසැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 65 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1980 අංක 52 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 62/80

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 52 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1979 අංක 15 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) "ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

'"ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" යන්නට, ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා හෝ අතිරේක හෝ නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වීම සඳහා හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා හෝ පත් කරන ලද යම් තැනැත්තෙක් ඇතුළත් වේ;'; තවද

(ආ) "සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

'"සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා" යන්නට, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා හෝ සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර පරීක්ෂකවරයා වීම සඳහා හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා හෝ පත් කරන ලද යම් තැනැත්තෙක් ඇතුළත් වේ.'.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(4අ) පොලිස් නිලධරයකු ඉදිරියෙහි වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක, වරද සිදු කරන ලද ස්ථානයේ හෝ ඒ අසල සිටි යම් තැනැත්තකුගේ ප්‍රකාශය හා යම් සැකකරුවකුගේ ප්‍රකාශය ඔහු විසින් වාර්තාගත කරනු ලැබිය හැකි අතර, ඒ පොලිස් නිලධරයා, වරද සිදු කරන ලද්දේ යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා නොවන්නේ නම්, ඔහු විසින් ඒ පිළිබඳ සිද්ධි ඒ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වහාම වාර්තා කළ යුතු ය"; තවද

2—ජේ 51468—13,875 (80/09)

(ආ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“ (5) (අ) යම් වරදක් සිදු කරන ලද බව ලැබුණු තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් හෝ සැක කිරීමට පොලිස් ස්ථානය භාර නිලධරයකුට හෝ පරීක්ෂක වරයකුට හේතු තිබේ නම්, මේ පරිච්ඡේදය යටතේ මෙහි මින් මතු දක්වා ඇති ආකාරයෙන් ඔහු විසින් විමර්ශනයක් කළ යුතු ය ; නැතහොත් විමර්ශනයක් කිරීම සඳහා ඔහු විසින් බලය දිය යුතු ය :

එසේ වුව ද වරද සංජ්ඥෙය වරදක් වන්නේ නම් හෝ සාමය කඩ කිරීමක් සිදු කරන බව සැක කිරීමට ඔහුට හේතු තිබේ නම්, සැම පරීක්ෂකවරයකු ම සම්බන්ධයෙන් වන විට ඒ සැම පරීක්ෂකවරයකු විසින් ම, ඒ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ පිළිබඳ වාර්තාවක් වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; පොලිස් ස්ථානය භාර නිලධරයකු සම්බන්ධයෙන් වන විට ඒ නිලධරයා විසින් ඔහුගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් වහාම ඉදිරිපත් කළ යුතු ය ; තවද ඒ පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු විමර්ශනය කිරීමට ද වරදකරු වහාම සොයා සිරභාරයට ගැනීම පිණිස අවශ්‍ය යම් පියවර ගැනීමට ද ඒ ස්ථානයට ඒ සැම පරීක්ෂකවරයකු ම නැතහොත් පොලිස් ස්ථානය භාර නිලධරයකු පෞද්ගලිකව යා යුතු ය :

එසේ ම තවදුරටත්, ඒ විමර්ශනය කිරීම සඳහා වරදකරු සොයා සිරභාරයට ගැනීම පිණිස අවශ්‍ය යම් පියවර ගැනීම සඳහා ඒ ස්ථානයට යාම යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් තමාගේ යටත් නිලධරයන් අතුරින් යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(ආ) විමර්ශනයක් ආරම්භ කිරීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට පෙනී ගියහොත් ඒ කාරණය පිළිබඳව විමර්ශනය කිරීමට ඒ පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා බැඳී නොසිටිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(1) මේ පරිච්ඡේදය යටතේ වූ විමර්ශනයක් 37 වන වගන්තියෙන් නියම කරනු ලැබ ඇති පැය විසිහතරක කාලය ඇතුළත නිම කරනු ලැබිය නොහැකි සහ වැඩිදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය බව විශ්වාස කිරීමට හේතු ඇති කවර

හෝ විටක පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් හෝ පරීක්ෂක වරයා විසින්, සැකකරු ඒ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම ඉදිරිපත් කළ යුතු අතර, ඒ කාරණයට අදාළව ඒ විමර්ශනය කරනු ලබන අතරතුර විභාග කරනු ලැබූ එක් එක් සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශ කිසිවක් වේ නම්, ඒ ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් ද සමග, ඒ සිද්ධි පිළිබඳ වාර්තාවක් ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත එවේලේම යැවිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබෙන බව හෝ වැඩිදුර විමර්ශනය කිරීම අවශ්‍ය බව" යන වචන වෙනුවට "තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී ඇති බව" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "එවැනි යම් ආයුධයක්" යන වචන වෙනුවට "යම් ආයුධයක්" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(1) සංඥෙය නොවන යම් වරදක් විමර්ශනය කරන පරීක්ෂකවරයකු හෝ පොලිස් නිලධරයකු වෙත මේ පනතින් පවරා ඇත්තා වූ ද සංඥෙය වරදක් සම්බන්ධයෙන් පමණක් ක්‍රියාත්මක කළ හැකි වූ ද යම් බලයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය යයි ඔහුගේ මතය වන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයකුගෙන් අවසරය ලැබුණු විට ඒ සංඥෙය නොවන වරද සම්බන්ධයෙන් ඒ බලය ක්‍රියාත්මක කිරීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඈ) ඡේදයේ "දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන, 191 වන, 192 වන, 193 වන, 196 වන, 197 වන, 202 වන, 203 වන, 204 වන, 205 වන, 206 වන, 207 වන හා 223 වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන, 193 වන, 196 වන, 197 වන, 202 වන, 203 වන, 204 වන, 205 වන, 206 වන, 207 වන හා 223 වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඉ) ඡේදයේ "දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි හෝ ඒ සංග්‍රහයේ 290අ වගන්තිය යටතේ හෝ 291ආ වගන්තිය යටතේ හෝ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "දණ්ඩ නීති සංග්‍රහයේ 290අ වගන්තිය යටතේ හෝ 291ආ වගන්තිය යටතේ හෝ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; තවද

(ඇ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

'(5) මේ වගන්තියේ "වෙනත් නැනැත්තකු" යන යෙදුමට සාම නිලධරයකු ද ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු ය.

(6) 393 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් යම් නඩුවක් සම්බන්ධයෙන් තම බලතල ක්‍රියාත්මක කරන ලද්දේ ද ඒ නඩුවට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නඩුව පවත්වාගෙන යනු ලබන විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

142. (1) වරද හෝ වැරදි එකකට වඩා ඇති අවස්ථාවක වැරදි අතුරින් කවර හෝ වරදක් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට අයත් වන අවස්ථාවක හෝ නීතිපතිවරයා විසින් 145(ආ) වගන්තිය යටතේ හෝ 393(7)(ආ) වගන්තිය යටතේ හෝ මූලික පරීක්ෂණයක් පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයාට විධාන කරනු ලබන අවස්ථාවක හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් XV වන පරිච්ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) වරද, මහෙස්ත්‍රාත් අධිකරණයක දී ලඝු ආකාරයෙන් විභාග කරනු ලැබිය හැකි වරදක් බව පෙනී යන අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින් XVII වන පරිච්ඡේදයෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ඒ වරදට ප්‍රමාණවත් ලෙස දඬුවම් පමුණුවනු ලැබිය නොහැකි බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් ඔහු විසින් වැඩිදුර නඩු කටයුතු වහාම නතර කොට නඩු වාර්තාව නීතිපතිවරයා වෙත යවනු ලැබිය යුතු අතර ඉනික්බිතිව ඔහු නීතිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියාකළ යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" පොලිසියට කරන ලද ප්‍රකාශවලට චූදිතයා හිමිකම ලබන බව.

158. (1) චූදිතයකුගේ නඩු විභාගය ඉහළ අධිකරණයකට නඟනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ සාක්ෂි දෙන ලද සාක්ෂිකරුවන් විසින් පොලිසියට කරන ලද ප්‍රකාශවල සහ චූදිතයා විසින් පොලිසියට කරන ලද යම් ප්‍රකාශ වෙතොත්, ඒ ප්‍රකාශවල සහතික පිටපතක්, නඩු විභාගයට පෙර, යුක්තිසහගත කාලයක දී චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් නියෝග මඟින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණයක් අනුව ඒ සඳහා චූදිතයා විසින් ගෙවනු ලැබූ විට, අදාළ පොත්පත් තබා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඒ තැනැත්තා වෙත සහතික පිටපතක් සපයනු ලැබිය යුතු ය :

එසේ වුව ද අනුප්‍රමාණයක් එසේ නියම කරනු ලබන තෙක්, ගෙවිය යුතු අනුප්‍රමාණය, වචන එක් සියයක් සඳහා ශත විසිපහක් විය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය හැකි වරදක් ලෙස පළමුවන උපලේඛනයේ අටවන තීරයෙහි දක්වා නොමැති වරදක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තුගත නොකරන ලද යම් සාක්ෂිකරුවකු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශය, යුක්තිය ඉටුවීම පිණිස, කියවා බැලීම සඳහා චූදිතයාට හෝ ඔහුගේ නීතිඥවරයාට හෝ නීතිපතිවරයා විසින් ලබා දිය හැකි ය. ".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ආ) මේ පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වනු නොලැබූ අවස්ථාවක, චූදිතයා විසින් පොලිසියට කරන ලද ප්‍රකාශ ඇත්නම් එම ප්‍රකාශවල සහ අධිචෝදනා පත්‍රයෙහි ලැයිස්තුගත කරන ලද සාක්ෂිකරුවන් විසින් පොලිසියට කරන ලද ප්‍රකාශ ඇත්නම් එම ප්‍රකාශවල පිටපත් ; ".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 281 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 281 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) " වයස අවුරුදු දහසයට අඩු " යන වචන වෙනුවට " වයස අවුරුදු දහ අටට අඩු " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි පාර්ශ්ව සටහනෙහි " වයස අවුරුදු දහසයට අඩු " යන වචන වෙනුවට " වයස අවුරුදු දහ අටට අඩු " යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 393 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 393 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(7) මේ පනතේ ඇතුළත් වෙනත යම් විධිවිධාන නොතක නීතිපතිවරයා විසින්, යම් ලඝු වරදක් සම්බන්ධයෙන් වරදෙහි ස්වභාවය හෝ වෙනත් යම් කරුණු සලකා බලා—

(අ) මහාධිකරණය වෙත කෙලින් ම අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම, හෝ

(ආ) මූලික පරීක්ෂණයක දී වාර්තා ගත කරන ලද සාක්ෂි අධිචෝදනා පත්‍රයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නේ යයි නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක ඔහු විසින් නියම කොට දක්වනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් XV වන පරිච්ඡේදයේ සඳහන් කාර්ය පටිපාටිය අනුව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයාට විධාන කිරීම

නීත්‍යනුකූල වන්නේ ය; ඉන් අනතුරුව ඒ වරද මහෙස්ත්‍රාත් අධිකරණයක දී විභාග කරනු නොලැබිය යුතු ය.".

තවද

(ආ) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය එහි (8) වන උපවගන්තිය යනුවෙන් නැවත අංක යෙදීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තියෙහි, "නඩු විභාගය ඉහළ අධිකරණයට භාරදීම නිසා හෝ මහාධිකරණයේ පෙනී සිටීම පිණිස දුන් ඇපයක් අනුව හෝ මහාධිකරණය ඉදිරියෙහි පෙනී සිටින සියලු තැනැත්තන් ම" යන වචන වෙනුවට "මහාධිකරණය ඉදිරියෙහි පෙනී සිටින සියලු තැනැත්තන් ම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 443 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 443 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අවසන් කරන ලද හෝ විනිශ්චයට භාජනව පවත්නා හෝ නඩු කටයුතුවල සම්පූර්ණ වාර්තාවේ නැතහොත් ඉන් කොටසක හෝ සහතික පිටපතක් ලබා ගැනීමට නීතිපතිවරයාට, පැමිණිලිකරුට හා චූදිත තැනැත්තාට හිමිකම් ඇති බව.

443. යම් චූදිත තැනැත්තකුට විරුද්ධව වූ (විනිශ්චයට භාජනව පවත්නා හෝ අවසන් කරන ලද හෝ) නඩු කටයුතුවල සම්පූර්ණ වාර්තාවේ නැතහොත් ඉන් යම් කොටසක සහතික පිටපතක් ඉල්ලා සිටි විට අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රමාදයකින් තොරව, ඒ සම්පූර්ණ වාර්තාවේ හෝ එහි කොටසේ හෝ සහතික පිටපතක්—

(අ) කිසියම් ගෙවීමක් කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතු නීතිපතිවරයාට; හෝ

(ආ) 442 වන වගන්තියේ සඳහන් ප්‍රමාණය අනුව ඒ සඳහා ගාස්තු ගෙවනු ලැබූ විට පැමිණිලිකරුට හෝ සෑම චූදිත තැනැත්තකුට ම

නිකුත් කළ යුතුය.".

15. පහත දැක්වෙන වගන්තිය 456 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 456අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 456අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"පනත අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පැමිණිලි ආදියෙහි වලංගු භාවය කෙරෙහි බල නොපෑයුතු බව.

456අ. මේ පනතේ යම් විධිවිධානයකට අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා සැහෙන ප්‍රමාණයකින් යුක්තිය ඉටු නොවීමක් සිදුවී ඇත්නම් මිස, යම් පැමිණිල්ලක්, ඉහළ අධිකරණයකට නැඩීමක නැතහොත් අධි චෝදනාවක වලංගු භාවය හෝ යම් සාක්ෂියක ආවේශ්‍යතාව කෙරෙහි එවැනි පැහැර හැරීමක් බල නොපෑ යුතු ය; නැතහොත් බලපාන ලද්දේ යයි නොසැලැකිය යුතු ය.".

16. මේ පනතේ ඉහතින් වූ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර, මුල් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා හෝ අභියාචනයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් වෙනත් යම් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණාවලට ඒ විධිවිධාන අදාළ විය යුතු ය.

සංශෝධන අතීතයට බල පෑ යුතු බව.